(දසවැනි පාර්ලිමේන්තුව - පළමුවැනි සභාවාරය)

අංක 2(15).]

# පාර්ලිමේන්තුවේ අංක 2 දරන න්‍යාය පුස්තකය හා සම්බන්ධ පරිපූරකය

**නිකුත් කළේ 2025 නොවැම්බර් 08 සෙනසුරාදා**

---

**2025 නොවැම්බර් 15 සෙනසුරාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— සුරාබදු ආඥාපනත යටතේ රීති,— (52 අධිකාරය වූ) සුරාබදු ආඥාපනතේ 25 වගන්තිය සමඟ කියවිය යුතු 32 වගන්තිය යටතේ සුරාබදු බලපත්‍ර ගාස්තු සම්බන්ධයෙන් මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් 2025 ඔක්තෝබර් 04 දින පනවන ලදුව, 2025.11.08 දින ඉදිරිපත් කරන ලද රීති අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය,— මුදල් පනත යටතේ නියෝගය,— 2004 අංක 11 දරන මුදල් පනතේ 26 වගන්තිය සමඟ කියවිය යුතු 22 වගන්තිය යටතේ මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යවරයා විසින් පනවන ලදුව, 2025 අප්‍රේල් 01 දිනැති අංක 2430/14 දරන අති විශේෂ ගැසට් පත්‍රයේ පළ කරනු ලැබ, 2025.11.08 දින ඉදිරිපත් කරන ලද නියෝගය අනුමත කළ යුතු ය.

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)

*

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ වාර්ෂික වාර්තාව (2021),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2023.12.01 දින ඉදිරිපත් කරන ලද 2021.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් ශ්‍රී ලංකා රූපවාහිනී සංස්ථාවේ 2021 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබල ගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.07.09 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.09.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

*

සෞඛ්‍ය සහ ජනමාධ්‍ය අමාත්‍යතුමා,— සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ වාර්ෂික වාර්තාව (2022),— 1971 අංක 38 දරන මුදල් පනතේ 14 වගන්තිය යටතේ 2024.03.05 දින ඉදිරිපත් කරන ලද 2022.12.31 දිනෙන් අවසන් වූ වර්ෂය සඳහා පිළියෙළ කරන ලද විගණකාධිපතිවරයාගේ නිරීක්ෂණ ඇතුළත් සීමාසහිත ස්වාධීන රූපවාහිනී මාධ්‍ය ජාලයේ 2022 වර්ෂයේ වාර්ෂික වාර්තාව අනුමත කළ යුතු ය.

(සෞඛ්‍ය, ජනමාධ්‍ය සහ කාන්තා සවිබල ගැන්වීම පිළිබඳ ආංශික අධීක්ෂණ කාරක සභාව විසින් 2025.07.09 දින සලකා බලා එකී කාරක සභාවේ වාර්තාව 2025.09.09 දින පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන ලදී.)

**** සලකුණෙන් හඳුන්වනු ලබන්නේ ආණ්ඩුවේ කටයුතු ය.***

# වාචික පිළිතුරු අපේක්ෂා නොකරන ප්‍රශ්න

**(2025 නොවැම්බර් 19 බදාදා)**

1566/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අපරාධ නඩුවලදී වරදකරුවන් වන චූදිතයන් හට දඬුවම් පැමිණවීමේදී විනිශ්චයකාරවරුන් විසින් අනුගමනය කළ යුතු ප්‍රතිපත්තිය සහ මාර්ගෝපදේශ (Sentencing Policy and Guidelines), ශ්‍රී ලංකාවේ නීති පද්ධතිය තුළ පවතින්නේද;

(ii) අපරාධ නඩුවල දඬුවම් පැමිණවීමේ ප්‍රතිපත්තිය සහ මාර්ගෝපදේශ සකස් කිරීම සඳහා පත් කරන ලද කමිටුවේ වාර්තාව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) ශ්‍රී ලංකාවේ අපරාධ යුක්තිය පසඳලීම සඳහා වැදගත්වන සාධාරණ දණ්ඩනයක් පැනවීම සඳහා විනිශ්චයකාරවරුන්ට පිටිවහලක් වන්නා වූ, දඬුවම් පැමිණවීමේදී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති සහ මාර්ගෝපදේශ සකස් කිරීම සඳහා ඉදිරියේදී ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1567/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පානදුර, 'ද සිල්වා පාරේ' පිහිටි දිසා විනිසුරු නිල නිවාසය (පෙර චන්ද්‍රසේකර වලව්ව) අභාවිතය සහ නඩත්තු නොකිරීම හේතුවෙන් බරපතළ ලෙස විනාශවී ඇති බව දන්නේද;

(ii) එම පරිශ්‍රය නැවත භාවිතයට ගැනීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(iii) එම පරිශ්‍රය තුළ අඩක් ඉදිකොට අතහැර දමා තිබෙන ගොඩනැගිල්ල කවරේද;

(iv) එකී ගොඩනැගිල්ල ඉදිකිරීම සඳහා දැනට වැයකොට ඇති මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) පානදුර මහෙස්ත්‍රාත්වරුන්ගේ, දිසාවිනිසුරුවරුන්ගේ සහ මහාධිකරණ විනිසුරුවරයාගේ නිල නිවාස අවශ්‍යතාවය විසඳීම සඳහා ගනු ලබන පියවර කවරේද;

(ii) මින් පෙර විනිසුරු නිල නිවාස සඳහා භාවිතා කරන ලද, පානදුර මුහුදු වෙරළ ආසන්නයේ ඇති රජයට අයත් ඉඩම්වල බිම් ප්‍රමාණය කොපමණද;

(iii) එකී ඉඩම් ඵලදායි ලෙස භාවිතා කිරීම සඳහා ගනු ලබන පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1569/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) 'ආශා මිනරල්ස්' ආයතනය —

(i) මාස 6ක 'නියමු ව්‍යාපෘතියක්' සම්පූර්ණ කිරීමට පෙර සහ අමාත්‍ය මණ්ඩලයේ හෝ නීතිපතිවරයාගේ අනුමැතිය ලබා නොගෙන, අරුවක්කාලු හි ශ්‍රී ලංකා සිමෙන්ති සංස්ථාව සමඟ වසර 30ක ගිවිසුමකට එළඹුණේද;

(ii) වලංගු ඛනිජ බලපත්‍රයක් නොමැතිව පසුව පොලිස් වැටලීමකට තුඩු දුන් ඛනිජ වැලි කැණීමේ සහ සැකසීමේ කටයුතුවල මෙම ගිවිසුම යටතේ නිරත වූයේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) 'ආශා මිනරල්ස්' ආයතනය —

(i) රුපියල් 15,526,400/= ක් වටිනා අබලි ලෝහ ඉවත් කිරීම සඳහා 'ලංකා මිනරල් සැන්ඩ්ස් ලිමිටඩ්' සමඟ මුදා ගැනීමේ ගිවිසුමකට (salvage contract) එළඹුණේද;

(ii) නීතිපතිවරයාගේ විරෝධතා නොතකා, රුපියල් මිලියන 300 ක් වටිනා නැව්ගත කර තිබූ ඉල්මනයිට් මෙට්‍රික් ටොන් 25,000ක තොගයක් තමා සන්තකයට ගත්තේද;

(iii) අමාත්‍යාංශය යටතේ පවතින ඛනිජ වත්කම් ක්‍රමානුකූලව වෙනතකට හැරවීමට කටයුතු කර තිබේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) රාජ්‍ය සම්පත් ආරක්ෂා කිරීමට, වැරදිකරුවන් වගවියයුතු බවට පත් කිරීමට සහ නීත්‍යානුකූල බලපත්‍රලාභීන්ගේ අයිතිවාසිකම් නැවත ලබා දීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1579/2025

ගරු සුජීව දිසානායක මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අටවැනි පාර්ලිමේන්තුවේ 2015 සැප්තැම්බර් සිට පත් කරන ලද රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍යවරයාට එවකට පැවති රජයෙන් වෙන් කර තිබූ නිල රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල රථවල ලියාපදිංචි අංකය, වර්ගය සහ මාදිලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිල රථ වෙන් කර තිබූ කාලසීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් නිල රථයට හිමිව තිබූ මාසික ඉන්ධන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ අමාත්‍යවරයා රාජ්‍ය ව්‍යවසාය සංවර්ධන අමාත්‍ය ධුරය දරන ලද කාලසීමාවේදී, එම නිල රථ වෙනුවෙන් මාසිකව වැය කරන ලද ඉන්ධන ලීටර් ප්‍රමාණය සහ ඒ සඳහා දරන ලද වියදම, එක් එක් නිල රථය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1582/2025

ගරු සුජීව දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අටවැනි පාර්ලිමේන්තුවේ 2015 සැප්තැම්බර් සිට පත් කරන ලද පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍යවරයාට එවකට පැවති රජයෙන් වෙන් කර තිබූ නිල රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල රථවල ලියාපදිංචි අංකය, වර්ගය සහ මාදිලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිල රථ වෙන් කර තිබූ කාලසීමාව කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් නිල රථයට හිමිව තිබූ මාසික ඉන්ධන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ අමාත්‍යවරයා පාර්ලිමේන්තු ප්‍රතිසංස්කරණ හා ජනමාධ්‍ය අමාත්‍ය ධුරය දරන ලද කාලසීමාවේදී, එම නිල රථ වෙනුවෙන් මාසිකව වැය කරන ලද ඉන්ධන ලීටර් ප්‍රමාණය සහ ඒ සඳහා දරන ලද වියදම, එක් එක් නිල රථය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1585/2025

ගරු සුජීව දිසානායක මහතා,— නිවාස, ඉදිකිරීම් සහ ජල සම්පාදන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අටවැනි පාර්ලිමේන්තුවේ 2015 සැප්තැම්බර් සිට පත් කරන ලද නිවාස හා ඉදිකිරීම් අමාත්‍යවරයාට එවකට පැවති රජයෙන් වෙන් කර තිබූ නිල රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල රථවල ලියාපදිංචි අංකය, වර්ගය සහ මාදිලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිල රථ වෙන් කර තිබූ කාලසීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් නිල රථයට හිමිව තිබූ මාසික ඉන්ධන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ අමාත්‍යවරයා නිවාස හා ඉදිකිරීම් අමාත්‍ය ධුරය දරන ලද කාලසීමාවේදී, එම නිල රථ වෙනුවෙන් මාසිකව වැය කරන ලද ඉන්ධන ලීටර් ප්‍රමාණය සහ ඒ සඳහා දරන ලද වියදම, එක් එක් නිල රථය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1588/2025

ගරු සුජීව දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අටවැනි පාර්ලිමේන්තුවේ 2015 සැප්තැම්බර් සිට පත් කරන ලද නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍යවරයාට එවකට පැවති රජයෙන් වෙන් කර තිබූ නිල රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල රථවල ලියාපදිංචි අංකය, වර්ගය සහ මාදිලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිල රථ වෙන් කර තිබූ කාලසීමාව කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් නිල රථයට හිමිව තිබූ මාසික ඉන්ධන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ අමාත්‍යවරයා නගර සැලසුම් හා ජල සම්පාදන අමාත්‍ය ධුරය දරන ලද කාලසීමාවේදී, එම නිල රථ වෙනුවෙන් මාසිකව වැය කරන ලද ඉන්ධන ලීටර් ප්‍රමාණය සහ ඒ සඳහා දරන ලද වියදම, එක් එක් නිල රථය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1591/2025

ගරු සුජීව දිසානායක මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අටවැනි පාර්ලිමේන්තුවේ 2015 සැප්තැම්බර් සිට පත් කරන ලද මුදල් අමාත්‍යවරයාට එවකට පැවති රජයෙන් වෙන් කර තිබූ නිල රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල රථවල ලියාපදිංචි අංකය, වර්ගය සහ මාදිලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිල රථ වෙන් කර තිබූ කාලසීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් නිල රථයට හිමිව තිබූ මාසික ඉන්ධන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ අමාත්‍යවරයා මුදල් අමාත්‍ය ධුරය දරන ලද කාලසීමාවේදී, එම නිල රථ වෙනුවෙන් මාසිකව වැය කරන ලද ඉන්ධන ලීටර් ප්‍රමාණය සහ ඒ සඳහා දරන ලද වියදම, එක් එක් නිල රථය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1594/2025

ගරු සුජීව දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අටවැනි පාර්ලිමේන්තුවේ 2015 සැප්තැම්බර් සිට පත් කරන ලද කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යවරයාට එවකට පැවති රජයෙන් වෙන් කර තිබූ නිල රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල රථවල ලියාපදිංචි අංකය, වර්ගය සහ මාදිලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිල රථ වෙන් කර තිබූ කාලසීමාව කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් නිල රථයට හිමිව තිබූ මාසික ඉන්ධන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ අමාත්‍යවරයා කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍ය ධුරය දරන ලද කාලසීමාවේ දී, එම නිල රථ වෙනුවෙන් මාසිකව වැය කරන ලද ඉන්ධන ලීටර් ප්‍රමාණය සහ ඒ සඳහා දරන ලද වියදම, එක් එක් නිල රථය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1599/2025

ගරු සුජීව දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අටවැනි පාර්ලිමේන්තුවේ 2018 නොවැම්බර් 09 දින සිට පත් කරන ලද නිවාස හා සමාජ සුබසාධන අමාත්‍යවරයාට එවකට පැවති රජයෙන් වෙන් කර තිබූ නිල රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල රථවල ලියාපදිංචි අංකය, වර්ගය සහ මාදිලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිල රථ වෙන් කර තිබූ කාලසීමාව කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් නිල රථයට හිමිව තිබූ මාසික ඉන්ධන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ අමාත්‍යවරයා නිවාස හා සමාජ සුබසාධන අමාත්‍ය ධුරය දරන ලද කාලසීමාවේදී, එම නිල රථ වෙනුවෙන් මාසිකව වැය කරන ලද ඉන්ධන ලීටර් ප්‍රමාණය සහ ඒ සඳහා දරන ලද වියදම, එක් එක් නිල රථය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1601/2025

ගරු සුජීව දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අටවැනි පාර්ලිමේන්තුවේ 2018 නොවැම්බර් 09 දින සිට පත් කරන ලද නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍යවරයාට එවකට පැවති රජයෙන් වෙන් කර තිබූ නිල රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල රථවල ලියාපදිංචි අංකය, වර්ගය සහ මාදිලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිල රථ වෙන් කර තිබූ කාලසීමාව කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් නිල රථයට හිමිව තිබූ මාසික ඉන්ධන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ අමාත්‍යවරයා නගර සැලසුම් හා ජලසම්පාදන අමාත්‍ය ධුරය දරන ලද කාලසීමාවේදී, එම නිල රථ වෙනුවෙන් මාසිකව වැය කරන ලද ඉන්ධන ලීටර් ප්‍රමාණය සහ ඒ සඳහා දරන ලද වියදම, එක් එක් නිල රථය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1606/2025

ගරු සුජීව දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අටවැනි පාර්ලිමේන්තුවේ 2018 නොවැම්බර් 09 දින සිට පත් කරන ලද කර්මාන්ත හා වාණිජ අමාත්‍යවරයාට එවකට පැවති රජයෙන් වෙන් කර තිබූ නිල රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල රථවල ලියාපදිංචි අංකය, වර්ගය සහ මාදිලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිල රථ වෙන් කර තිබූ කාලසීමාව කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් නිල රථයට හිමිව තිබූ මාසික ඉන්ධන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ අමාත්‍යවරයා කර්මාන්ත හා වාණිජ අමාත්‍ය ධුරය දරන ලද කාලසීමාවේදී, එම නිල රථ වෙනුවෙන් මාසිකව වැය කරන ලද ඉන්ධන ලීටර් ප්‍රමාණය සහ ඒ සඳහා දරන ලද වියදම, එක් එක් නිල රථය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1609/2025

ගරු සුජීව දිසානායක මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමූපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අටවැනි පාර්ලිමේන්තුවේ 2018 නොවැම්බර් 09 දින සිට පත් කරන ලද වෙළෙඳ, පාරිභෝගික, සමූපකාර සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍යවරයාට එවකට පැවති රජයෙන් වෙන් කර තිබූ නිල රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල රථවල ලියාපදිංචි අංකය, වර්ගය සහ මාදිලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිල රථ වෙන් කර තිබූ කාලසීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් නිල රථයට හිමිව තිබූ මාසික ඉන්ධන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ අමාත්‍යවරයා වෙළෙඳ, පාරිභෝගික, සමූපකාර සංවර්ධන හා ක්‍රිස්තියානි ආගමික කටයුතු අමාත්‍ය ධුරය දරන ලද කාලසීමාවේදී, එම නිල රථ වෙනුවෙන් මාසිකව වැය කරන ලද ඉන්ධන ලීටර් ප්‍රමාණය සහ ඒ සඳහා දරන ලද වියදම, එක් එක් නිල රථය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1611/2025

ගරු සුජීව දිසානායක මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අටවැනි පාර්ලිමේන්තුවේ 2015 සැප්තැම්බර් සිට පත් කරන ලද ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍යවරයාට එවකට පැවති රජයෙන් වෙන් කර තිබූ නිල රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල රථවල ලියාපදිංචි අංකය, වර්ගය සහ මාදිලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිල රථ වෙන් කර තිබූ කාලසීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් නිල රථයට හිමිව තිබූ මාසික ඉන්ධන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ අමාත්‍යවරයා ජාතික ප්‍රතිපත්ති හා ආර්ථික කටයුතු අමාත්‍ය ධුරය දරන ලද කාලසීමාවේදී, එම නිල රථ වෙනුවෙන් මාසිකව වැය කරන ලද ඉන්ධන ලීටර් ප්‍රමාණය සහ ඒ සඳහා දරන ලද වියදම, එක් එක් නිල රථය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1614/2025

ගරු සුජීව දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අටවැනි පාර්ලිමේන්තුවේ 2015 සැප්තැම්බර් සිට පත් කරන ලද ජාතික සංවාද පිළිබඳ අමාත්‍යවරයාට එවකට පැවති රජයෙන් වෙන් කර තිබූ නිල රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල රථවල ලියාපදිංචි අංකය, වර්ගය සහ මාදිලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිල රථ වෙන් කර තිබූ කාලසීමාව කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් නිල රථයට හිමිව තිබූ මාසික ඉන්ධන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ අමාත්‍යවරයා ජාතික සංවාද පිළිබඳ අමාත්‍ය ධුරය දරන ලද කාලසීමාවේදී, එම නිල රථ වෙනුවෙන් මාසිකව වැය කරන ලද ඉන්ධන ලීටර් ප්‍රමාණය සහ ඒ සඳහා දරන ලද වියදම, එක් එක් නිල රථය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1617/2025

ගරු සුජීව දිසානායක මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අටවැනි පාර්ලිමේන්තුවේ 2015 සැප්තැම්බර් සිට පත් කරන ලද රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍යවරයාට එවකට පැවති රජයෙන් වෙන් කර තිබූ නිල රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල රථවල ලියාපදිංචි අංකය, වර්ගය සහ මාදිලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිල රථ වෙන් කර තිබූ කාලසීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් නිල රථයට හිමිව තිබූ මාසික ඉන්ධන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ අමාත්‍යවරයා රාජ්‍ය පරිපාලන හා කළමනාකරණ අමාත්‍ය ධුරය දරන ලද කාලසීමාවේදී, එම නිල රථ වෙනුවෙන් මාසිකව වැය කරන ලද ඉන්ධන ලීටර් ප්‍රමාණය සහ ඒ සඳහා දරන ලද වියදම, එක් එක් නිල රථය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1618/2025

ගරු සුජීව දිසානායක මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නවවැනි පාර්ලිමේන්තුවේ 2020 අගෝස්තු 12 දින සිට පත් කරන ලද බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍යවරයාට එවකට පැවති රජයෙන් වෙන් කර තිබූ නිල රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල රථවල ලියාපදිංචි අංකය, වර්ගය සහ මාදිලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිල රථ වෙන් කර තිබූ කාලසීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් නිල රථයට හිමිව තිබූ මාසික ඉන්ධන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ රාජ්‍ය අමාත්‍යවරයා බතික්, අත්යන්ත්‍ර රෙදි හා දේශීය ඇඟළුම් නිෂ්පාදන රාජ්‍ය අමාත්‍ය ධුරය දරන ලද කාලසීමාවේදී, එම නිල රථ වෙනුවෙන් මාසිකව වැය කරන ලද ඉන්ධන ලීටර් ප්‍රමාණය සහ ඒ සඳහා දරන ලද වියදම, එක් එක් නිල රථය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1621/2025

ගරු සුජීව දිසානායක මහතා,— කර්මාන්ත සහ ව්‍යවසායකත්ව සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අටවැනි පාර්ලිමේන්තුවේ 2019 නොවැම්බර් 27 දින සිට පත් කරන ලද කර්මාන්ත රාජ්‍ය අමාත්‍යවරයාට එවකට පැවති රජයෙන් වෙන් කර තිබූ නිල රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල රථවල ලියාපදිංචි අංකය, වර්ගය සහ මාදිලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිල රථ වෙන් කර තිබූ කාලසීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් නිල රථයට හිමිව තිබූ මාසික ඉන්ධන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ රාජ්‍ය අමාත්‍යවරයා කර්මාන්ත රාජ්‍ය අමාත්‍ය ධුරය දරන ලද කාලසීමාවේදී, එම නිල රථ වෙනුවෙන් මාසිකව වැය කරන ලද ඉන්ධන ලීටර් ප්‍රමාණය සහ ඒ සඳහා දරන ලද වියදම, එක් එක් නිල රථය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1624/2025

ගරු සුජීව දිසානායක මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) අටවැනි පාර්ලිමේන්තුවේ 2018 නොවැම්බර් 01 දින සිට පත් කරන ලද නිපුණතා සංවර්ධන හා වෘත්තීය පුහුණු අමාත්‍යවරයාට එවකට පැවති රජයෙන් වෙන් කර තිබූ නිල රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල රථවල ලියාපදිංචි අංකය, වර්ගය සහ මාදිලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිල රථ වෙන් කර තිබූ කාලසීමාව කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් නිල රථයට හිමිව තිබූ මාසික ඉන්ධන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ අමාත්‍යවරයා නිපුණතා සංවර්ධන හා වෘත්තිය පුහුණු අමාත්‍ය ධුරය දරන ලද කාලසීමාවේදී, එම නිල රථ වෙනුවෙන් මාසිකව වැය කරන ලද ඉන්ධන ලීටර් ප්‍රමාණය සහ ඒ සඳහා දරන ලද වියදම, එක් එක් නිල රථය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1627/2025

ගරු සුජීව දිසානායක මහතා,— තරුණ කටයුතු සහ ක්‍රීඩා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අටවැනි පාර්ලිමේන්තුවේ 2015 සැප්තැම්බර් 04 දින සිට පත් කරන ලද ක්‍රීඩා අමාත්‍යවරයාට එවකට පැවති රජයෙන් වෙන් කර තිබූ නිල රථ සංඛ්‍යාව කොපමණද;

(ii) එම නිල රථවල ලියාපදිංචි අංකය, වර්ගය සහ මාදිලිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එකී නිල රථ වෙන් කර තිබූ කාලසීමාව කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එක් එක් නිල රථයට හිමිව තිබූ මාසික ඉන්ධන ප්‍රමාණය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) අදාළ අමාත්‍යවරයා ක්‍රීඩා අමාත්‍ය ධුරය දරන ලද කාලසීමාවේදී, එම නිල රථ වෙනුවෙන් මාසිකව වැය කරන ලද ඉන්ධන ලීටර් ප්‍රමාණය සහ ඒ සඳහා දරන ලද වියදම, එක් එක් නිල රථය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 නොවැම්බර් 28 සිකුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

826/2025

ගරු එස්. එම්. මරික්කාර් මහතා,— වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2019 ජනවාරි 01 දින සිට මේ දක්වා ශ්‍රී ලංකන් එයාර් ලයින්ස් ආයතනය ලබා ඇති සම්පූර්ණ අලාභය කොපමණද;

(ii) ඒ අතරින් මෙහෙයුම් අලාභය කොපමණද;

(iii) එම ආයතනය විසින් ගුවන්යානා සඳහා ගෙවනු ලබන වාර්ෂික ලීසිං වාරිකය/ ණය වාරිකය කොපමණද;

(iv) එම ලීසිං වාරිකය/ණය වාරිකය ගෙවනු ලබන ගුවන්යානා සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ඉහත ආයතනය විසින් ලබා ගෙන ඇති මුළු ණය ප්‍රමාණය කොපමණද;

(ii) එම ණය වෙනුවෙන් වාර්ෂිකව ගෙවිය යුතු මුළු ණය වාරිකය කොපමණද;

(iii) එම ණය වාරිකයේ ඇති ප්‍රාග්ධන මුදල හා පොළී මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම් ඒ මන්ද?

1062/2025

ගරු රෝහිත අබේගුණවර්ධන මහතා,— මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවට නැවත වාහන ආනයනය කිරීමට අවසර ලබා දීමෙන් පසු මේ වනවිට ආනයනය කර ඇති වාහන සංඛ්‍යාව කොපමණද;

(ii) එම වාහනවලින් අය කර ගත යුතු බදු මුදල එන්ජින් ධාරිතාවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වාහන ආනයනය කිරීමෙන් උපයා ගැනීමට අපේක්ෂිත බදු මුදල සහ එයින් මේ වනවිට උපයා ගෙන ඇති බදු මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ශ්‍රී ලංකාවට නැවත වාහන ආනයනය කිරීමට අවසර ලබා දීමෙන් පසු මේ වනවිට ආනයනය කර ඇති ත්‍රීරෝද රථ සංඛ්‍යාව සහ යතුරු පැදි සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) ආනයනික ත්‍රීරෝද රථයකට අය කරනු ලබන බදු මුදල කොපමණද;

(iii) ආනයනික යතුරු පැදියකට අය කරනු ලබන බදු මුදල එන්ජින් ධාරිතාවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1278/2025

ගරු අජිත් ගිහාන් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාවට අයත් ඉඩම්වලින් ආයෝජන ව්‍යාපෘතිවලට ලබාදී ඇති ඉඩම් කවරේද;

(ii) එම එක් එක් ඉඩම ලබාදී ඇති ආයෝජන ව්‍යාපෘතිය, ඉඩමේ ප්‍රමාණය සහ පිහිටා ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම ඉඩම් සඳහා ගෙවිය යුතු බදු මුදල් නියමිත පරිදි ගෙවා තිබේද;

(iv) නොඑසේ නම්, බදු මුදල් ගෙවීම පැහැර හැර තිබේද;

(v) ආයෝජන ව්‍යාපෘති සඳහා ලබා දුන් ඉහත ඉඩම් සංවර්ධනය කර තිබේද;

(vi) ඒවා අතරින් ඌන සංවර්ධිත ඉඩම් හඳුනාගෙන තිබේද;

(vii) ආයෝජන ව්‍යාපෘති සඳහා ලබා දුන් ඉහත ඉඩම් නිසි පරිදි සංවර්ධනය කර නොමැති නම් හෝ බදු ගෙවීම් පැහැර හැර තිබේ නම්, ඒවා නැවත පවරා ගන්නේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) පුත්තලම දිස්ත්‍රික්කයේ ඉහත කොමිෂන් සභාවට අයත් මුළු ඉඩම් ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම ඉඩම්, නිවාස ඉදිකිරීම සඳහා ලබා දෙන්නේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1313/2025

ගරු නිශාන්ත පෙරේරා මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ඇල්පිටිය අධ්‍යාපන කලාපය තුළ පිහිටා ඇති රජයේ නොවන පාසැල් කවරේද;

(ii) එම එක් එක් පාසැල ආරම්භ කරන ලද වර්ෂය සහ පාලක මණ්ඩලයේ සාමාජිකයන්ගේ නම් වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම පාසැල් අධීක්ෂණය කරනු ලබන රජයේ ආයතන කවරේද;

(iv) මධ්‍යම රජයේ අධ්‍යාපන අමාත්‍යාංශයට හෝ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයට එම පාසැල් සම්බන්ධයෙන් මහජන පැමිණිලි ලැබී තිබේද;

(v) එම පාසැල්වලින් ලබා දෙන අධ්‍යාපනයේ ගුණාත්මකභාවය සහ එම පාසැල්වල සිසුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා කිරීම සඳහා ගෙන ඇති ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1430/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වැලිමඩ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අලංකාලගාල ග්‍රාම නිලධාරි වසමේ, හරක්ගමකන්ද ග්‍රාමයේ, අක්කර පහක පමණ විශාලත්වයකින් යුතු රජයේ ඉඩමක් ශ්‍රී ලංකා ගුවන් විදුලි සංස්ථාවට වෙන් කර තිබූ බව දන්නේද;

(ii) එම ඉඩම විධිමත් පරිදි සංස්ථාවට බැහැර කර තිබුණේද;

(iii) එම ඉඩම සංස්ථාව විසින් තෙවන පාර්ශ්වයකට ලබාදී ඇති බව දන්නේද;

(iv) එය නීත්‍යානුකූල වන්නේද;

(v) එම තෙවන පාර්ශ්වය කවුරුන්ද;

(vi) අදාළ තෙවන පාර්ශ්වය විසින් ගෙවීමට ඇති හිඟ බදු මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) හිඟ බදු මුදල් ගෙවීමට තිබියදී, ඉහත ඉඩම පෞද්ගලික බැංකුවකට උකස් කර ණය මුදලක් ලබා ගැනීමට අනුමැතියදී තිබේද;

(ii) එසේ නම් එය, නීති විරෝධී නොවන්නේද;

(iii) ඉහත ඉඩම පැවරීමේදී සහ හිඟ බදු මුදල් ගෙවීමට තිබියදී ණයක් ලබා ගැනීමට කටයුතු කිරීමේදී, ඉඩම් කොමසාරිස් ජනරාල් දෙපාර්තමේන්තුව නීතිය උල්ලංඝනය කර තිබේද;

(iv) ඉහත ඉඩම නැවත රජයට පවරා ගැනීමට කටයුතු කරන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

**2025 නොවැම්බර් 29 සෙනසුරාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

818/2025

ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා අධ්‍යාපන පරිපාලන සේවයේ හා ශ්‍රී ලංකා විදුහල්පති සේවයේ නිලධාරින් අතරින් මේ වනවිට වැටුප් වර්ධක අත්හිටුවා ඇති නිලධාරින් සංඛ්‍යාව එක් එක් සේවය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් නිලධාරියාගේ නම, වැටුප් වර්ධකය අත්හිටවන ලද දිනය සහ ඊට හේතු වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එම නිලධාරින්ගේ වැටුප් වර්ධක නැවත ලබා දීම ඉතා මන්දගාමීව සිදු වන බව දන්නේද;

(iv) එම නිලධාරින් සම්බන්ධයෙන් කරනු ලබන පරීක්ෂණ කඩිනම් කර, වැටුප් වර්ධක ලබාදී ඔවුන්ට සාධාරණයක් ඉටු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

881/2025

ගරු (ආචාර්ය) එම්. එල්. ඒ. එම්. හිස්බුල්ලාහ් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) රජය විසින් පිරිනමනු ලබන 'දීමනා පත්‍ර' (Deed of Grant) හෝ 'ඉඩම් බලපත්‍ර' (Land Permit) නොමැතිව මඩකලපුව දිස්ත්‍රික්කයේ, මන්මුනෙපත්තු ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ඇති රජයේ ඉඩම්වල පුද්ගලයන් පදිංචිවී සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම පුද්ගලයින්ගේ සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(iii) එම රජයේ ඉඩම්වලින් ඉහත පුද්ගලයන් නීත්‍යානුකූලව ඉවත් කිරීම සඳහා 2017.01.01 සිට 2025.03.31 දින දක්වා වූ කාලසීමාවේදී අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් ඔවුන්ට එරෙහිව අධිකරණයේ නඩු පවරා තිබේද;

(iv) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(v) අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු පැවරූ පුද්ගලයන් අතරින් 2017.01.01 සිට 2025.03.31 දක්වා වූ කාලසීමාවේදී අධිකරණ නියෝග මත රජයේ ඉඩම්වලින් ඉවත් කරන ලද පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(vi) නඩු පැවරිය යුතු එහෙත් අදාළ ප්‍රාදේශීය ලේකම්වරයා විසින් නඩු නොපවරන ලද පුද්ගලයන් සිටින්නේද;

(vii) එසේ නම්, එම පුද්ගලයන් සංඛ්‍යාව, ඔවුන්ගේ නම් සහ අදාළ විස්තර කවරේද;

(viii) කිහිපදෙනෙකුට එරෙහිව පමණක් නඩු පැවරීමටත්, වැඩි පිරිසකට එරෙහිව නඩු නොපැවරීමටත් හේතු කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1243/2025

ගරු සුසන්ත කුමාර නවරත්න මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2024-2025 වර්ෂය තුළදී ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව විසින් ගොඩ කිරීම සඳහා අනුමතිය ලබාදී ඇති අනුරාධපුර දිස්ත්‍රික්කයේ මුළු කුඹුරු ඉඩම් ප්‍රමාණය, එම එක් එක් කුඹුරු ඉඩම හිමිකරුගේ නම, අනුමතිය ලබා දුන් කුඹුරු ඉඩමේ විශාලත්වය සහ අනුමතිය ලබා දීමට හේතුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) ඊට අදාළව, ගොවිජන සංවර්ධන කොමසාරිස් ජනරාල්ගේ අත්සනින් යුතුව නිකුත් කරන ලද ලිපිවල පිටපත් ඉදිරිපත් කරන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1327/2025

ගරු සුජීව දිසානායක මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති A, B, C සහ D ශ්‍රේණිවලට අයත් මාර්ගවල දුර එක් එක් ශ්‍රේණිය අනුව කිලෝ මීටර්වලින් වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම එක් එක් ශ්‍රේණියට අයත් මාර්ග නඩත්තු කරනු ලබන ආයතන වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) වර්ෂ 2015 සිට 2024 දක්වා මාර්ග සංවර්ධනය කිරීම සඳහා ආරම්භ කරන ලද ව්‍යාපෘති කවරේද;

(ii) එම ව්‍යාපෘතිවලින් සංවර්ධනය කරන ලද මාර්ගවල දුර කිලෝ මීටර්වලින් කොපමණද;

(iii) එම ව්‍යාපෘති මඟින් කුරුණෑගල දිස්ත්‍රික්කයේ මාර්ග ඉදිකර තිබේද;

(iv) එසේ නම්, එම මාර්ගවල දුර කිලෝ මීටර්වලින් කොපමණද;

(v) ඒ සඳහා වියදම් කරන ලද මුළු මුදල කොපමණද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1570/2025

ගරු ලාල් ප්‍රේමනාත් මහතා,— ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබල ගැන්වීම් අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) සමෘද්ධි සංවර්ධන නිලධාරින්ගේ විශ්‍රාම වැටුප් හිමිකම් සහ හිඟ මුදල් ගෙවීම් සම්බන්ධයෙන් පවතින නොවිසඳුණු ගැටලු කවරේද;

(ii) ඒවා විසඳීමට රජය ගෙන ඇති කඩිනම් ක්‍රියාමාර්ග සහ ඒ සඳහා වන නිශ්චිත කාල වකවානු කවරේද;

(iii) ඔවුන්ගේ උසස්වීම් ලබාදීමේ සහ ශ්‍රේණිගත කිරීමේ නිසි පරිපාටියක් කඩිනමින් ක්‍රියාත්මක කිරීමට සැලසුම් කර තිබෙන්නේද;

(iv) එසේ නම්, එහි වත්මන් ප්‍රගතිය කවරේද;

(v) සමෘද්ධි සංවර්ධන නිලධාරින් සම්බන්ධයෙන් වාර්තා වන අපචාර හා දූෂණ සිදුවීම් සම්බන්ධයෙන්, විනය ක්‍රියාමාර්ග කඩිනම් කිරීමට ගෙන ඇති පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) සමෘද්ධි බැංකු පද්ධතිය පරිගණකගත කිරීමේ ව්‍යාපෘතිය සම්පූර්ණ කිරීමට ගෙන ඇති පියවර කවරේද යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 දෙසැම්බර් 01 සඳුදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

679/2025

ගරු හෙක්ටර් අප්පුහාමි මහතා,— බලශක්ති අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) නොරොච්චෝලේ ගල් අඟුරු බලාගාරයේ දහනයෙන් පසු එකතු වන අළු විකිණීමෙන් 2015 වර්ෂයේ සිට මේ දක්වා උපයන ලද ආදායම එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම අළු විකිණීමේදී අනුගමනය කරන ලද ක්‍රමවේදය කවරේද;

(iii) එලෙස උපයන ලද ආදායමෙන් එම බලාගාරය අවට පදිංචිවී සිටින පාරිසරික ගැටලුවලට මුහුණදී සිටින ජනතාවගේ සුභසාධනය වෙනුවෙන් වැය කරන ලද මුදල කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

741/2025

ගරු (වෛද්‍ය) කවින්ද හේෂාන් ජයවර්ධන මහතා,— වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) බස්නාහිර පළාත් සමුපකාර සංවර්ධන දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි කර ඇති සමුපකාර ග්‍රාමීය බැංකු ශාඛා සංඛ්‍යාව කොපමණද;

(ii) ඒවායේ නම් කවරේද;

(iii) එම සමුපකාර ග්‍රාමීය බැංකු අතරින් මේ වනවිට අක්‍රිය තත්ත්වයේ පවතින සමුපකාර ග්‍රාමීය බැංකු ශාඛා සංඛ්‍යාව කොපමණද;

(iv) ඒ හේතුවෙන් සිය තැන්පතු මුදල් නැවත ලබා ගැනීමට නොහැකිවී සිටින ඉහත බැංකුවල තැන්පත්කරුවන්ට සාධාරණයක් ඉටු කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

811/2025

ගරු මුජිබුර් රහුමාන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) කොළඹ මහා නගර සභා බලප්‍රදේශයේ ඇති, මධ්‍යම රජයට සහ පළාත් සභාවට අයත් පාසැල් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම පාසැල්වල නම් කවරේද;

(iii) මේ වනවිට එම පාසැල්වල පවතින ගුරු හා අනධ්‍යයන කාර්ය මණ්ඩලයේ පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් අධ්‍යාපන කලාපය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) කොළඹ මහා නගර සහා බලප්‍රදේශයේ ඇති පාසැල් සංවර්ධනය කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

851/2025

ගරු නීතිඥ චමින්ද්‍රාණි කිරිඇල්ල මහත්මිය,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පල්ලෙකැලේ, දුම්බර බන්ධනාගාරයේ මේ වනවිට රඳවා සිටින රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම බන්ධනාගාරයේ රැඳවීමට හැකි රැඳවියන් සංඛ්‍යාව කොපමණද;

(iii) එම බන්ධනාගාරයේ නව ඉදිකිරීම් කඩිනම් කර, මේ වනවිට බන්ධනාගාරයේ පවතින තදබදය අවම කිරීම සඳහා ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1009/2025

ගරු රජීවන් ජෙයවන්ද්‍රමූර්ති මහතා,— අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) මැර කණ්ඩායම්වල ප්‍රචණ්ඩත්වයට ගොදුරු වූවන්ට සහ ඔවුන්ගේ පවුල්වලට රජය විසින් මූල්‍ය වන්දි, වෛද්‍ය ආධාර හෝ පුනරුත්ථාපන වැඩසටහන් වැනි නිශ්චිත ස්වරූපයේ ආධාර හඳුන්වාදී හෝ හඳුන්වා දීමට අදහස් කර තිබේද;

(ii) මැර කණ්ඩායම්වල ප්‍රචණ්ඩකාරී සිද්ධීන් ඇතිවූ දිස්ත්‍රික්ක හෝ පළාත් තුළ, එවැනි ආධාර යෝජනා ක්‍රම ක්‍රියාත්මක කිරීමේ වත්මන් තත්ත්වය කවරේද;

(iii) එවැනි වින්දිතයින්ට නිසි කලට සහයෝගය සහ දිගු කාලීන සහාය ලබා දීම සහතික කිරීම සඳහා, පළාත් සභා හෝ දිස්ත්‍රික් ලේකම් කාර්යාල වෙත කිසියම් චක්‍රලේඛ, මාර්ගෝපදේශ හෝ ප්‍රතිපත්ති රාමු නිකුත් කර තිබේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 දෙසැම්බර් 02 අඟහරුවාදා**

# වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1174/2025

ගරු සුනිල් රත්නසිරි මහතා,— මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ඇති පොලිස් ස්ථාන සංඛ්‍යාව කොපමණද;

(ii) ශ්‍රී ලංකා පොලීසියේ මේ වනවිට සේවය කරනු ලබන මුළු නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(iii) ශ්‍රී ලංකා පොලීසියේ මේ වනවිට පවතින පුරප්පාඩු සංඛ්‍යාව එක් එක් නිලය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම පුරප්පාඩු පිරවීමට කටයුතු කරන්නේද;

(v) එසේ නම්, එම පුරප්පාඩු පුරවනු ලබන දිනය එක් එක් නිලය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) 2024 වර්ෂයේ සිට 2025 මැයි මාසය දක්වා අත්අඩංගුවට ගන්නා ලද සංවිධානාත්මක අපරාධකරුවන් සංඛ්‍යාව එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) මේ වනවිට ශ්‍රී ලංකා පොලීසියේ සිදුවන අක්‍රමිකතා හඳුනාගෙන තිබේද;

(iii) එසේ නම්, එම අක්‍රමිකතා මැඩපැවැත්වීම සඳහා ගෙන ඇති පියවර කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1267/2025

ගරු එම්.එස්. උදුමාලෙබ්බෙ මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) පසුගිය රජය විසින් නැගෙනහිර පළාතේ අම්පාර, මඩකලපුව සහ ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කවල ඉඩම් බලපත්‍ර සඳහා හිමිකම් ඔප්පු ලබාදීමේ වැඩසටහන යටතේ මහජනතාවගෙන් ලබාගන්නා ලද ඉඩම් බලපත්‍ර සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම දිස්ත්‍රික්ක සඳහා නිකුත් කර ඇති හිමිකම් ඔප්පු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) තවදුරටත් නිකුත් කිරීමට ඇති හිමිකම් ඔප්පු සංඛ්‍යාව එක් එක් දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) එම හිමිකම් ඔප්පු කඩිනමින් ලබාදීම සඳහා අමාත්‍යාංශය විසින් ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1363/2025

ගරු තුරෙරාසා රවිකරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) යම් පාසැලක අවුරුදු අටකට වැඩි කාලයක් සේවය කරමින් සිටින විදුහල්පතිවරුන්ගේ සංඛ්‍යාව එක් එක් පළාත අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(ii) විදුහල්පතිවරයෙක් එකම පාසැලක අවුරුදු අටකට වැඩි කාලයක් අඛණ්ඩව සේවයේ යෙදීම හේතුවෙන් උද්ගතවී ඇති ගැටලු කවරේද;

(iii) 2012 වර්ෂයේදී අධි සේවක පදනම මත, විදුහල්පතිවරුන් ලෙස අන්තර්ග්‍රහණය කරනු ලැබ ඇති තැනැත්තන් හට උසස්වීම් ලබාදී ඇතත්, ඔවුන්ගේ සේවයට අදාළ පරිපාලන දීමනා ලබාදී නොමැති බව දන්නේද;

(iv) ඒ සඳහා ඇති බාධා කවරේද;

(v) පාසැල්වල පවතින විදුහල්පති පුරප්පාඩු සඳහා, අධි සේවක පදනමේ සිටින විදුහල්පතිවරුන්ට අයදුම් කිරීමට පවතින බාධා කවරේද;

(vi) අවුරුදු අටකට වැඩි කාලයක් එකම පාසැලක අධි සේවක පදනම මත සේවය කරන විදුහල්පතිවරුන්ට, ස්ථාන මාරු ලබා දීමේ හැකියාව කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1562/2025

ගරු (මහාචාර්ය) එල්.එම්. අබේවික්‍රම මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) 'ළඟම පාසැල හොඳම පාසැල' ව්‍යාපෘතිය යටතේ, මාතර දිස්ත්‍රික්කයේ පාසැල්වල යටිතල පහසුකම් සංවර්ධනය කිරීම සඳහා ආරම්භ කරන ලද ව්‍යාපෘති සඳහා වියදම් කර ඇති මුළු මුදල කොපමණද;

(ii) ඉහත (i)හි සඳහන් ව්‍යාපෘති අතුරින්, වැඩ නිම කර ඇති සහ වැඩ නිම කිරීමට නොහැකිවූ ව්‍යාපෘති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) එම ව්‍යාපෘති යටතේ ඉදිකරන ලද මේ වනවිට භාවිතයට ගත නොහැකි තත්ත්වයේ පවතින මාතර දිස්ත්‍රික්කයේ ඌරුබොක්ක ජාතික පාසැලේ ගුරු නේවාසිකාගාර දෙක, භාවිතයට ගත හැකි තත්ත්වයට පත්කිරීම සඳහා ඇති බාධා කවරේද;

(ii) ඒවා භාවිතයට ගත හැකි තත්ත්වයට පත්කිරීම සඳහා ක්‍රියාත්මක කිරීමට අපේක්ෂිත සැලසුම් කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1655/2025

ගරු චානක මාදුගොඩ මහතා,— ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) අන්තර්ගතික සම්බන්ධිත සංවර්ධන ව්‍යාපෘතිය (Inclusive Connectivity and Development Project) ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ මේ වනවිට කාපට් අතුරා සංවර්ධනය කර ඇති මාර්ගවල දුර ප්‍රමාණය කොපමණද;

(iii) එම එක් එක් මාර්ගයේ නම සහ වැය කරන ලද මුදල දිස්ත්‍රික්කය අනුව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iv) වැඩ ආරම්භ කර, එහෙත් වැඩ අවසන් කර නොමැති මාර්ග සංඛ්‍යාව කොපමණද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ගාල්ල දිස්ත්‍රික්කයේ ඉහත ව්‍යාපෘතිය ආරම්භ කරන ලද දිනය කවරේද;

(ii) එම ව්‍යාපෘතිය යටතේ ගාල්ල දිස්ත්‍රික්කයේ මේ වනවිට කාපට් අතුරා සංවර්ධනය කර ඇති මාර්ගවල දුර ප්‍රමාණය සහ එයට වැය කරන ලද මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) ගාල්ල දිස්ත්‍රික්කයට අදාළව එම ව්‍යාපෘතියේ වර්තමාන ප්‍රගතිය කවරේද;

(iv) ඉහත ව්‍යාපෘතිය ගාල්ල දිස්ත්‍රික්කය තුළ ආරම්භ කිරීමට දීර්ඝ කාලයක් ගතවීමට හේතු කවරේද;

(v) ඉහත ව්‍යාපෘතිය අවසන් කිරීමට නියමිත දිනය කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 දෙසැම්බර් 03 බදාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1087/2025

ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) පාසැල් අධ්‍යාපනයට සමගාමීව පෞද්ගලික අධ්‍යාපන ආයතනද අධ්‍යාපන සංවර්ධනයට සැලකිය යුතු දායකත්වයක් ලබා දෙන බවත්;

(ii) ඒවා නියාමනය කිරීම සඳහා නීතිමය යාන්ත්‍රණයක් නොමැති වීමෙන් ගැටලු රාශියක් පැන නැගී ඇති බවත්;

(iii) පෞද්ගලික අධ්‍යාපන ආයතනවලින් ලබාදෙන අධ්‍යාපනයේ ගුණාත්මකභාවය, ගුරුවරුන්ගේ අධ්‍යාපන මට්ටම, යටිතල පහසුකම්වල ගුණාත්මකභාවය සහ මූලික සෞඛ්‍ය පහසුකම් ආදිය සම්බන්ධයෙන් නිසි අවධානයක් යොමු නොවන බවත්;

එතුමිය පිළිගන්නෙහිද?

(ආ) (i) එසේ නම්, මේ සම්බන්ධයෙන් ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(ii) ඒ සඳහා ගත වන කාලය කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1183/2025

ගරු සිවඥානම් ශ්‍රීතරන් මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (1)

(අ) (i) යාපනය දිස්ත්‍රික්කයේ, එළුවතිව් දූපතේ ඇති රජයේ පාසැල් සංඛ්‍යාව කොපමණද;

(ii) එළුවතිව් දූපතේ ඇති සරවනබවා විද්‍යාලයේ සිසුන් එම විද්‍යාලයේම පිහිටුවන ලද විභාග මධ්‍යස්ථානයේම අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට අවසාන වරට පෙනී සිටි වර්ෂය කවරේද;

(iii) ඉහත විද්‍යාලයේ සිසුන් අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගයට මේ වනවිට පෙනී සිටින විභාග මධ්‍යස්ථානය කවරේද;

(iv) අ.පො.ස. (සාමාන්‍ය පෙළ) විභාගය එළුවතිව් දූපතේ පැවැත්වීමට ඇති බාධා කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1219/2025

ගරු සුරංග රත්නායක මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකාවේ සිටින කිරි ගොවීන් සංඛ්‍යාව සහ දෛනික කිරි නිෂ්පාදනය ලීටර්වලින් කොපමණද;

(ii) අනුරාධපුර දිස්ත්‍රික්කයේ සිටින කිරි ගොවීන් සංඛ්‍යාව සහ එම දිස්ත්‍රික්කයේ දෛනික කිරි නිෂ්පාදනය ලීටර්වලින් කොපමණද;

(iii) මේ වනවිට කිරි ලීටරයක් සඳහා ගෙවනු ලබන මුදල කොපමණද;

(iv) එම මුදල මෑතකදී සංශෝධනය කරනු ලැබුවේද;

(v) එසේ නම්, ඊට හේතු කවරේද;

(vi) කිරි ගොවීන් නගා සිටුවීමට ගනු ලබන පියවර කවරේද;

යන්න එතුමා සඳහන් කරන්නෙහිද?

(ආ) (i) 2025/2026 මහ කන්නයේදී රජය වී මිලදී ගැනීමට අපේක්ෂා කරන්නේද;

(ii) වී මිලදී ගැනීම සඳහා පෞද්ගලික ව්‍යාපාරිකයන්ට ණය ලබා දෙන්නේද;

(iii) වී අලෙවි මණ්ඩලයේ අසාදු ලේඛනගත ව්‍යාපාරිකයන්ටත් ණය ලබා දෙන්නේද;

(iv) වී කිලෝවක් සඳහා සාධාරණ මිලක් ලබා දෙන්නේද;

(v) එසේ නම්, එක් එක් වී වර්ගය අනුව එම මිල වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්නත් එතුමා සඳහන් කරන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1317/2025

ගරු කේ. කාදර් මස්තාන් මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) වවුනියාව දිස්ත්‍රික්කයේ ඇති ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතරේ ජීවත් වන මධ්‍යම පාන්තිකයන් සඳහා ඉඩම් ලබා දීමේ වැඩසටහන යටතේ මේ වනවිට ලබාදී ඇති මුළු ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(ii) එම ඉඩම් ප්‍රමාණය එක් එක් ග්‍රාම නිලධාරි වසම අනුව වෙන් වෙන් වශයෙන් අක්කරවලින් කොපමණද;

(iii) ඉහත (i)හි සඳහන් ඉඩම් අතරින් දෙවන පාර්ශ්වයන්ට ලබාදී ඇති ඉඩම් ප්‍රමාණය අක්කරවලින් කොපමණද;

(iv) එම එක් එක් ඉඩම ලබාදී ඇති දෙවන පාර්ශ්වයේ නම, ඉඩම අයත් වන ග්‍රාම නිලධාරි වසම සහ ඉඩම ලබා දෙන ලද පදනම වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) දෙවන පාර්ශ්වයන්ට ලබා දෙන ලද ඉහත ඉඩම්වල පසුගිය කාලයේදී රජයේ නිවාස යෝජනා ක්‍රම ක්‍රියාත්මක කර තිබෙන බව දන්නේද;

(ii) එම නිවාස ඉදිකර ඇති ඉඩම් නිසි පරිදි අදාළ ප්‍රතිලාභීන්ට ලබාදී තිබේද;

(iii) එසේ නම්, ඊට අදාළ ලියකියවිලි මේ වනතෙක් ඔවුන්ට ලබා නොදීමට හේතු කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1475/2025

ගරු රොෂාන් අක්මීමන මහතා,— පරිසර අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය තුළ වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතේ ගැසට් කර හෝ හඳුනාගෙන ඇති රක්ෂිත වනාන්තර ප්‍රමාණය සහ රක්ෂිත වනාන්තර බවට පත් කිරීමට යෝජිත වනාන්තර ප්‍රමාණය හෙක්ටයාර්වලින් කොපමණද;

(ii) දීර්ඝ කාලයක් තිස්සේ පදිංචිවී ඇති හෝ වගා කටයුතු සඳහා භාවිතා කර ඇති නමුත් පසුව වන සංරක්ෂණ දෙපාර්තමේන්තුව යටතට ගෙන ඇති ඉඩම් ප්‍රමාණය එම දිස්ත්‍රික්කයේ එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) එම ඉඩම්වලින් නැවත නිදහස් කිරීම සඳහා නිර්දේශ කර ඇති ඉඩම් ප්‍රමාණය එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iv) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ අලි-මිනිස් ගැටුම පාලනය කිරීම සඳහා සකස් කර ඇති වැඩපිළිවෙළ කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2025 දෙසැම්බර් 05 සිකුරාදා**

## වාචික පිළිතුරු අපේක්ෂා කරන ප්‍රශ්න

1309/2025

ගරු චන්දන සූරියආරච්චි මහතා,— අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) ශ්‍රී ලංකාවේ ජාතික පාසැල්වලට හා පළාත් සභා පාසැල්වලට අනුයුක්ත කර ඇති මුළු සංවර්ධන නිලධාරීන් සංඛ්‍යාව කොපමණද;

(ii) එම සංවර්ධන නිලධාරීන් අනුයුක්ත කරන ලද වර්ෂ සහ එම එක් එක් වර්ෂයේදී අනුයුක්ත කර ඇති සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) රජයේ ගුරු පුරප්පාඩු පිරවීමේදී ඉහත සංවර්ධන නිලධාරීන් සඳහා යම් සහනයක් ලබා දිය හැකිද;

(iv) එසේ නම්, එම සහන කවරේද;

යන්න එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) රජයේ ගුරු පුරප්පාඩුවලට බඳවාගැනීම සඳහා පැවැත්වීමට නියමිතව තිබූ තරඟ විභාගයට එරෙහිව ශ්‍රේෂ්ඨාධිකරණයේ පැවති නඩුව මේ වනවිට අවසන්වී තිබේද;

(ii) එසේ නම්, ශ්‍රේෂ්ඨාධිකරණය විසින් ලබාදී ඇති නිර්දේශ/නියෝග කවරේද;

යන්නත් එතුමිය මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

1322/2025

ගරු සුගත් වසන්ත ද සිල්වා මහතා, — අග්‍රාමාත්‍යතුමිය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගෙන් ඇසීමට,— (2)

(අ) (i) රජයේ විශ්වවිද්‍යාවල ඉගෙනුම ලබන ආබාධ සහිත සිසුන් සංඛ්‍යාව එක් එක් විශ්වවිද්‍යාලය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) එම සිසුන්ගේ ආබාධ වර්ග කවරේද;

(iii) එම එක් එක් ආබාධ වර්ගයට අදාළ සිසුන් සංඛ්‍යාව වෙන් වෙන් වශයෙන් කොපමණද;

යන්න එතුමිය සඳහන් කරන්නෙහිද?

(ආ) (i) රජයේ විශ්වවිද්‍යාලවලට ආබාධ සහිත සිසුන් ඇතුළත් කරගැනීමේ ක්‍රමවේදය කවරේද;

(ii) එම ක්‍රමවේදය යාවත්කාලීන සහ විධිමත් කිරීමට ගනු ලබන ක්‍රියාමාර්ග කවරේද;

(iii) රජයේ විශ්වවිද්‍යාල සඳහා ආබාධ සහිත සිසුන් ඇතුළත් කර ගැනීමේදී කෝටා ක්‍රමයක් ක්‍රියාත්මක වන්නේද;

(iv) ආබාධ සහිත සිසුන් සඳහා අන්තර්කරණීය අධ්‍යයන ක්‍රමවේදයක් ක්‍රියාත්මක කර තිබේද;

(v) එසේ නම්, එය ක්‍රියාත්මක කරනු ලබන ආකාරය කවරේද;

යන්නත් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඇ) (i) අභිමත ඕනෑම විෂයධාරාවක් හැදෑරීමට විශ්වවිද්‍යාලවල ආබාධ සහිත සිසුන්ට අවකාශ තිබේද;

(ii) එම සිසුන් මේ වනවිට හදාරනු ලබන විෂයධාරාවන් කවරේද;

(iii) විවිධ විෂයධාරාවන් හැදෑරීමට ආබාධ සහිත සිසුන් යොමු නොවීමට හේතු කවරේද;

යන්න තවදුරටත් එතුමිය සඳහන් කරන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1349/2025

ගරු උපුල් කිත්සිරි මහතා,— කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) 2020 වර්ෂයේ සිට 2024 දක්වා වී මිලදී ගැනීම සඳහා වී අලෙවි මණ්ඩලයට වෙන් කරන ලද මුදල එක් එක් වර්ෂය අනුව වෙන් වෙන් වශයෙන් කොපමණද;

(ii) 2025 වර්ෂය තුළදී වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගැනීමට අපේක්ෂිත වී ප්‍රමාණය සහ ඒ සඳහා එම මණ්ඩලයට වෙන් කරනු ලබන මුදල වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) වී මිලදී ගැනීම සඳහා පෞද්ගලික ව්‍යාපාරිකයන්ට රජය විසින් මූල්‍ය සහ අනෙකුත් පහසුකම් ලබාදී තිබේද;

(iv) වී අලෙවි මණ්ඩලය විසින් මිලදී ගනු ලබන වී ප්‍රමාණය වෙළඳපොලට නිකුත් කිරීමට නිසි යාන්ත්‍රණයක් සකස් කර තිබේද;

(v) ඉදිරි කන්නයේ වී මිලදී ගැනීම සඳහා පෞද්ගලික අංශය සමඟ ඒකාබද්ධ යාන්ත්‍රණයක් සකස් කිරීමට පියවර ගන්නේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) නොඑසේ නම්, ඒ මන්ද?

1506/2025

ගරු මයිල්වාගනම් ජෙගදීස්වරන් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) (i) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ බොහෝ නිලධාරීන් වසර දහයකට අධික කාලයක් ස්ථාන මාරුවීම් නොමැතිව සිටින බව දන්නේද;

(ii) එසේ නම්, එම නිලධාරීන් සඳහා ස්ථාන මාරු ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීමට ගෙන ඇති පියවර කවරේද;

(iii) නිසි ස්ථාන මාරුවීම් නොමැතිවීම හේතුවෙන්, දිස්ත්‍රික් හා ප්‍රාදේශීය මට්ටමින් පරිපාලන අකාර්යක්ෂමතාව සහ පක්ෂග්‍රාහීත්වය වැනි ගැටලු මතුවී ඇති බව දන්නේද;

(iv) එසේ නම්, ඒවා විසඳීම සඳහා ගන්නා පියවර කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) නිර්දේශිත ස්ථාන මාරුවීම් කාලය ඉක්මවා සිටින නිලධාරීන් හඳුනාගැනීමට විනිවිදභාවයෙන් යුතු, ස්ථිර වැඩපිළිවෙළක් තිබෙන්නේද;

(ii) නොඑසේ නම්, ස්ථාන මාරුවීම් ක්‍රියාවලියේ සාධාරණත්වය සහ වගකීම්සහගතභාවය සහතික කිරීමේ ක්‍රමවේදයක් ඇති කරන්නේද;

(iii) චක්‍රීය ක්‍රමයෙන් යුතු පත්කිරීම් වැනි ප්‍රතිසංස්කරණ යොදා ගැනීමේ හැකියාව කවරේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) (i) ශ්‍රී ලංකා පරිපාලන සේවයේ නිලධාරීන් සඳහා වන ස්ථාන මාරු ප්‍රතිපත්තිය, නවීන පරිපාලන ප්‍රමිතීන්ට අනුකූලව සංශෝධනය කරන්නේද;

(ii) නොඑසේ නම්, එම ස්ථාන මාරුවීම් විධිමත් කිරීමට ගන්නා පියවර කවරේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) නොඑසේ නම්, ඒ මන්ද?

1554/2025

ගරු ඉම්රාන් මහරූෆ් මහතා,— රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමාගෙන් ඇසීමට,— (1)

(අ) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ —

(i) ස්ථාපිත ප්‍රාදේශීය ලේකම් කාර්යාල කවරේද;

(ii) එක් එක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ ජනගහනය සහ ඒවායේ ජනවාර්ගික සංයුතිය වෙන් වෙන් වශයෙන් කවරේද;

(iii) එක් එක් ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළ ග්‍රාම නිලධාරි කොට්ඨාස ගණන වෙන් වෙන් වශයෙන් කවරේද;

යන්න එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ආ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ තිබෙන මැතිවරණ කොට්ඨාස සංඛ්‍යාව සහ ඒවා කවරේද;

(ii) එම කොට්ඨාසවල ජනගහනය වෙන් වෙන් වශයෙන් කොපමණද;

(iii) මුතූර් සහ ත්‍රිකුණාමලය මැතිවරණ කොට්ඨාසයන්ගේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල දෙක බැගින්ද, සේරුවිල මැතිවරණ කොට්ඨාසයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල හයක්ද, පිහිටුවා ඇති බව දන්නේද;

යන්නත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඈ) (i) ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ දෙමළ භාෂාව කතා කරන ජනතාව බහුලව ජීවත්වන ප්‍රදේශවලට අදාළ ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටුවීමේදී, අසාධාරණයක් සිදුවී ඇති බව පිළිගන්නේද;

(ii) ඉදිරියේදී, නව ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස පිහිටුවීමේදී, ත්‍රිකුණාමලය නගර හා කඩවත් ප්‍රාදේශීය සභාවට, කින්නියා ප්‍රාදේශීය සභාව සහ තෝප්පූර් උප-ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් ප්‍රදේශ සඳහා, වෙන වෙනම ප්‍රාදේශීය ලේකම් කාර්යාල පිහිටුවීමට පියවර ගන්නේද;

යන්න තවදුරටත් එතුමා මෙම සභාවට දන්වන්නෙහිද?

(ඇ) නොඑසේ නම්, ඒ මන්ද?

---

**2026 ජනවාරි 09 සිකුරාදා**

## යෝජනා පිළිබඳ දැනුම්දීම සහ දිනට නියමිත කටයුතු

පා. 97/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ශ්‍රී ලංකාවේ දරු උපත් සංඛ්‍යාව ඉහළ දැමීම සඳහා පවුල් ඒකකයන් වෙත දිරි දීමනාවක් ලබා දීම,— 2018 වසරේ සිට මේ දක්වා ශ්‍රී ලංකාවේ වාර්ෂික දරු උපත් සංඛ්‍යාව අඛණ්ඩව පහත යමින් තිබෙන බව නිරීක්ෂණය වී ඇති හෙයින් ද, එහි ප්‍රතිඵලයක් ලෙස අනාගතයේ ශ්‍රී ලංකාවේ තරුණ ජනගහනය පහළ යාම නියත වශයෙන් සිදුවන හෙයින් ද, තරුණ ජනගහනය පහළ යාම ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධන ක්‍රියාදාමයට ඉතා අගතිදායක ලෙස බලපාන හෙයින් ද, ශ්‍රී ලංකාවේ දරු උපත් සංඛ්‍යාව ඉහළ දැමීම සඳහා පවුල් ඒකක වෙත ආකර්ශණීය දිරි දීමනාවක් ලබා දීමට රජය විසින් පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 98/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— 'සූර්ය බල සංග්‍රාමය' ව්‍යාපෘතිය ප්‍රවර්ධනය කිරීම,— ශ්‍රී ලංකාවේ බලශක්ති මූලාශ්‍රයන් අතරින් සූර්ය විදුලි බලය ලාබදායි සහ පරිසර හිතකාමී මූලාශ්‍රයක් ලෙස හඳුනාගෙන ඇති හෙයින් ද, 2016.09.06 දින ආරම්භ කරන ලද 'සූර්ය බල සංග්‍රාමය' (Battle for Solar Energy) ව්‍යාපෘතිය මඟින් දැනටමත් ජාතික විදුලි පද්ධතියට සූර්ය විදුලි බලය 2000 MWට වැඩි ප්‍රමාණයක් එක් කර ඇති හෙයින් ද, විදුලි ඒකකයක මිල අඩු කිරීමේ ක්‍රමවේදයක් සහ පරිසරය ආරක්ෂා කිරීමේ උපාය මාර්ගයක් ලෙස, 'සූර්ය බල සංග්‍රාමය' ව්‍යාපෘතිය තවදුරටත් ප්‍රවර්ධනය කොට ආරක්ෂා කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 99/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— 'කළුතර මුහුදු වෙරළ කලාපය' විශේෂිත ආර්ථික කලාපයක් ලෙස ප්‍රවර්ධනය කිරීම,— කළුතර නගරය මුල් කරගත් සංචාරක කලාපයක් සංවර්ධනය කිරීම වෙනුවෙන් ද, කළු ගඟේ මෝය සහ මුහුදු වෙරළ ආරක්ෂා කිරීමේ උපාය මාර්ගයක් ලෙස ද, කැලිඩෝ මුහුදු වෙරළ සහ කළු ගඟේ මෝය වෙනස් වීම හේතුවෙන් අලුතින් බිහිවී ඇති ගොඩබිම ඇතුළත්, 'කළුතර මුහුදු වෙරළ කලාපය', විශේෂිත ආර්ථික කලාපයක් ලෙස ප්‍රවර්ධනය කොට සංවර්ධනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 100/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— 'මිල්ලනිය අපනයන සැකසුම් කලාපය' ඉදිකිරීම කඩිනම් කිරීම,— කළුතර දිස්ත්‍රික්කයේ, 'මිල්ලනිය අපනයන සැකසුම් කලාපය' (Millaniya Export Processing Zone) සඳහා අවශ්‍ය ඉඩම් අක්කර 240ක් දැනටමත් පවරා ගෙන ඇති හෙයින් ද, එම ව්‍යාපෘතිය සඳහා අධිවේගී මාර්ග පිවිසුම්, නළ ජලය සහ විදුලිය ලබා දීම සඳහා රජය විසින් රුපියල් බිලියනයකට ආසන්න මුදලක් දැනටමත් වැයකර ඇති හෙයින් ද, එම අපනයන සැකසුම් කලාපය සඳහා තෝරාගත් භූමිය එවැනි ව්‍යාපෘතියක් සඳහා සුදුසු බවට ශ්‍රී ලංකා ආයෝජන මණ්ඩලය විසින් දැනටමත් හඳුනාගෙන ඇති හෙයින් ද, එම අපනයන සැකසුම් කලාපය ඉදිකිරීම රජයේ ප්‍රමුඛ ව්‍යාපෘතියක් ලෙස සලකා අවශ්‍ය ඉදිරි පියවර ගත යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 101/2025

ගරු අජිත් පී. පෙරේරා මහතා,— ඉංග්‍රීසි භාෂාවෙන් ද්විතියික අධ්‍යාපනය ලබාදීම ප්‍රවර්ධනය කිරීම,— ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 18(3) ව්‍යවස්ථාව ප්‍රකාරව 'ඉංග්‍රීසි භාෂාව' ශ්‍රී ලංකාවේ සන්ධාන භාෂාව (Link Language) ලෙස පිළිගෙන ඇති හෙයින් ද, ජාත්‍යන්තර භාෂාවක් වන 'ඉංග්‍රීසි භාෂාව' පුරවැසියන්ට දැනුම ලබා ගැනීමේ ප්‍රධාන උපාය මාර්ගයක් ලෙස හඳුනාගෙන ඇති හෙයින් ද, ශ්‍රී ලංකාවේ සියලු පුරවැසියන්ට භාෂා හෝ ජාති භේදයක් නොමැතිව එකම රටක ජීවත් වීම සඳහා අවශ්‍ය වන සන්ධාන භාෂාව ලෙස ඉංග්‍රීසි භාෂාවේ ප්‍රවීණතාවය ලබා ගැනීම ඉතා වැදගත් වන හෙයින් ද, නිදහස් අධ්‍යාපන සංකල්පය තුළ බිහි වූ ශ්‍රී ලංකාවේ මධ්‍ය මහා විද්‍යාල පද්ධතිය තුළ සහ තවත් පාසැල් ගණනාවක ඉංග්‍රීසි භාෂාවෙන් ද්විතීයික අධ්‍යාපනය ලබාදීමේ ක්‍රමවේදය සාර්ථක වී ඇති හෙයින් ද, ශ්‍රී ලංකාවේ පුරවැසියන්ට ජාත්‍යන්තර රැකියා අවස්ථාවන් ලබා ගැනීම උදෙසා ඉංග්‍රීසි භාෂාවෙන් ලැබෙන අධ්‍යාපනය අතිශය වැදගත් වන හෙයින් ද, ශ්‍රී ලංකාවේ සියලුම ද්විතියික පාසැල් වල (Secondary Schools) ඉංග්‍රීසි මාධ්‍යයෙන් (English Medium) අධ්‍යාපනය ලබා දිය යුතු යැයි ද, ඒ සඳහා ප්‍රමාණවත් ආයෝජනයක් සිදු කිරීම සඳහා රජය ප්‍රමුඛතාවය ලබා දිය යුතු යැයි ද මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.

පා. 102/2025

ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා,— ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සඳහා ඉංජිනේරු පීඨයක් ස්ථාපනය කිරීම,— ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය දේශීය හා විදේශීය රැකියා වෙළඳපොළ තුළ අවශ්‍යතා සපුරාලන නවීන තාක්ෂණික උපාධිධාරීන් පිරිසක් සපයන විශ්වවිද්‍යාලයක් වන හෙයින්, ශ්‍රී ලංකාවේ වර්ධනය වන ඉදිකිරීම්, කාර්මික, කර්මාන්ත සහ තොරතුරු තාක්ෂණ ක්ෂේත්‍රවල මෙන්ම ගෝලීය අවශ්‍යතාවන් ද සලකමින්, ඌව වෙල්ලස්ස විශ්වවිද්‍යාලය සඳහා ඉංජිනේරු පීඨයක් ස්ථාපනය කළ යුතු යැයි මෙම පාර්ලිමේන්තුව යෝජනා කරයි.